# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2376/11 – 2024 මාර්තු මස 18 වැනි සඳුදා – 2024.03.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2022/157.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ආර්. යූ. එස්. ප්‍රනාන්දු මයා, අංක 174, ඇලන් මාවත, කරගම්පිටිය, දෙහිවල.

සහ

මර්කන්ටයිල් ප්‍රොඩියුස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 133, ජාවත්ත පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිළියන්දල, බුද්ධාලෝක පාර, අංක 40, ආචාර්ය කේ. ඒ. තිලකරත්න මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

1A – G 041614 – 19 (2024/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/01/2022/157.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ආර්. යූ. එස්. ප්‍රනාන්දු මයා, අංක 174, ඇලන් මාවත, කරගම්පිටිය, දෙහිවල.

සහ

මර්කන්ටයිල් ප්‍රොඩියුස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 133, ජාවත්ත පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,**

“මර්කන්ටයිල් ප්‍රොඩියුස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සේවය කළ ආර් යූ. එස්. ප්‍රනාන්දු මහතාගේ සේවය විනය හේතුන් මත 2014.07.24 වෙනි දිනැති ලිපිය මගින් 2014.06.26 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවීම හා ඔහුට විරුද්ධව කිසිදු විනය පරීක්ෂණයක් සිදු නොකර පත්වීම් ලිපිය ප්‍රකාරව ඔහුගේ වයස අවුරුදු 55 වන තෙක් එනම් 2017.03.14 වෙනි දින දක්වා වැටුප් නොගෙවීම මගින් ආර්. යූ. එස්. ප්‍රනාන්දු මහතාට අසාධාරණයක් සිදුව තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ.”

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් *(වැ. බ.).*

2024 පෙබරවාරි මස 29 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 03 – 0147

---

මගේ අංකය: IR/COM/03/2022/15.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වැනි පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2024.02.17 වැනි දින අංක 2371/61 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.02.07 වැනි දින දරන නියෝගයෙන්,

ජේ. එස්. ඊ. කරුණාරත්න මයා, බී 2/32, නියදගල, මීපිටිය, කෑගල්ල.

සහ

මහජන බැංකුව, ප්‍රධාන කාර්යාලය, 12 වැනි මහල, අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර පවත්නා 2024.01.16 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතීඥ ආර්. නවෝදයම් මයා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු නීතීඥ ආර්. නවෝදයම් මයා මෙම ආරාවුලෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2024.02.07 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

EOG 03 – 0148/1

---

මගේ අංකය: IR/COM/03/2022/15.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ජේ. එස්. ඊ. කරුණාරත්න මයා, බී 2/32, නියදගල, මීපිටිය, කෑගල්ල.

සහ

මහජන බැංකුව, ප්‍රධාන කාර්යාලය, 12 වැනි මහල, අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිළියන්දල, බුද්ධාලෝක පාර, අංක 40, ආචාර්ය කේ. ඒ. තිලකරත්න මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2022/15.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ජේ. එස්. ඊ. කරුණාරත්න මයා, බී 2/32, නියදගල, මීපිටිය, කෑගල්ල.

සහ

මහජන බැංකුව, ප්‍රධාන කාර්යාලය, 12 වැනි මහල, අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,**

"මහජන බැංකුවේ මාණ්ඩලික සහකාර II ලෙස සේවය කළ ජේ. එස්. ඊ කරුණාරත්න මහතා බරපතල විෂමාචාර චෝදනා යටතේ සේවයෙන් පහකර 2017.06.09 දින නැවත සේවයෙහි පිහිටුවීම පමණක් සිදු කර,

1. සේවයෙන් පහකළ කාලයට හා වැඩ තහනම්ව සිටි කාලයට (2015.12.29 සිට 2017.06.09) හිඟ වැටුප් හා අනෙකුත් දීමනා නොගෙවීම.

2. උසස්වීම් ලබා නොදීම.
3. මහජන බැංකුවේ කළමනාකාර (3-1) තනතුර සඳහා බඳවා ගැනීම වෙනුවෙන් පවත්වන ලද විභාගයට පෙනී සිටීමට ඉඩ නොදීම.

යන කාරණා මගින් ජේ. එස්. ඊ. කරුණාරත්න මහතාට අසාධාරණයක් සිදුව තිබේ ද, යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.”

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් *(වැ. බ.).*

2024 මාර්තු මස 04 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 03 – 0148/2

---

මගේ අංකය: IR/COM/05/2018/190.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

පී. ඒ. බෝගොඩ මයා, අංක 71, සුසිරිපාය, උතුවම් බෝගහවත්ත, වේයන්ගොඩ.

සහ

උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, 223, බ්ලූමැන්ඩල් පාර, කොළඹ 13.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ල, කිතුලම්පිටිය, වේවැල්වල පාර, 10/51, වසන්ත වික්‍රමරත්න පුංචිහේවා මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2018/190.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

පී. ඒ. බෝගොඩ මයා, අංක 71, සුසිරිපාය, උතුවම් බෝගහවත්ත, වේයන්ගොඩ.

සහ

උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, 223, බ්ලූමැන්ඩල් පාර, කොළඹ 13.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,**

"උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ 1986.12.01 සිට 2017.02.28 දින දක්වා සේවය කළ පී. ඒ. බෝගොඩ මහතාට පාරිතෝෂික මුදල් ගෙවීමේ දී වසරකට මාසයක වැටුප පදනම් කරගෙන නොගෙවීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද, යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් *(වැ. බ.).*

2024 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 03 – 0149

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.